# සිංහල නවකතාවේ නව ප්‍රවණතා:

# දේශපාලන නවකතා.

වාගව්මනගේ පේමචන්ද්‍ර

ප්‍රවේශ අංකය 078

වර්ග අංකය

ශ්‍රී ලංකා කැලණි විශ්ව විද්‍යාලයයේ ශාස්ත්‍රපති(එම්.ඒ)

උපාධිය සඳහා ඉදිරිපත් කරන

නිබන්ධය.

1

## ග්‍රන්ථ සාරාංශය.

සාහිත්‍යය හා දේශපාලනය අතර ඇති සම්බන්ධය පැරණි යුගයේ සිට මේ දක්වා පැවති බවට පැරණි විශ්ව සාහිත්‍යයෙන් සාධක ලැබී තිබේ. ග්‍රීක හා රෝම වැනි අපරදිග පැරණි සාහිත්‍යයන්හි මෙන් ම පෙරදිග පැරණි සාහිත්‍යයන්හි ද සාහිත්‍යය හා දේශපාලනය අතර කිට්ටු සම්බන්ධතාවක් පැවති බව පැහැදිලි කරුණකි.

මුල් යුගවල දී ලේඛකයන් තම සාහිත්‍ය කෘතිවල දේශපාලන තොරතුරු ඇතුලත් කෙලේ ඒ මගින් ජනතාවට කෙලින් ම දේශපාලනය හා සම්බන්ධ ව දැනුමක් ලබා දීමට නොවේ. එහෙත් කාර්මික විප්ලවයෙන් පසු යුරෝපයේ සිදු වූ ආර්ථික හා දේශපාලනික වෙනස්වීම් වලින් වෙන් වී කටයුතු කිරීමට ලේඛකයාට නො හැකි විය.

සාහිත්‍යය මේ යුගයේ පෙරට වඩා පොදු ජනතාව අතර ප්‍රචලිත වීමත් ලේඛකයා රටේ ආර්ථික හා දේශපාලන වෙනස්වීම් කෙරෙහි අවධානය ඇඩි ලෙස යොමු කිරීමත් නිසා දේශපාලන නවකථාව බිහිවීමට පරිසරය සකස්විය.

දේශපාලන නවකථාව වෙනත් නවකථාවලින් වෙනස් වන ආකාරය පිළිබඳ ව විචාරකයෝ කරුණු දැක්වූහ. එපමණක් නොව දේශපාලන නවකථාවේ සිදුවී බෙදීම් කෙරෙහි ද ඔවුන්ගේ අවධානය යොමු විය. ඉතාලි, ප්‍රංශ, රුසියන් හා ඇමරිකානු යන සාහිත්‍යයන්හි දේශපාලන නවකථාව පුබල බවට පත් විය. මෙසේ ජනප්‍රිය වූ දේශපාලන නවකථාව ලංකාව වැනි ආසියානු රටවලත් අප්‍රිකානු රටවලත් සාහිත්‍යයන් කෙරෙහි සෘජුවත් වක්‍රවත් බලපාන්නට විය.

නිදහස ලබා ගැනීමෙන් පසු 1950 දශකයේදී ශ්‍රී ලංකාවේ ඇති වූ ආර්ථික, දේශපාලනික හා සාමාජයීය පරිවර්තනයන් නිසා සිංහල ලේඛකයන්ගේ අවධානය දේශපාලන නවකථාව කෙරෙහි යොමු වූ බව පෙනේ . මෙම අතලොස්සක් වූ නවකථාකරුවන්ගේ

අභිප්‍රාය වූයේ කාලීන ආර්ථික, දේශපාලනික හා සාමාජයීය ජීවිතය තුළ ජීවත් වන මිනිසුන් හා ගැහැණුන් මුහුණ පාන කරදර හා දුක් කම් කටොලු සංවේදනශීලීව ඉදිරිපත් කිරීමයි.

පූර්ව බටහිර සාහිත්‍ය විචාරකයන් මෙන් ම සිංහල විචාරකයන් ද ගොඩ නැගූ විචාර සම්ප්‍රදායයන් හා සිද්ධාන්තයන් අනුගමනය කරමින් සිංහල දේශපාලන නවකථා කරුවන්ගේ නිර්මාණ පිළිබඳ ව ඇගයීමක් ද මෙම කෘතියෙන් ඉදිරිපත් කෙරේ.